[අන්තර්ජාල අනුවාදයකි]

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1999 අංක 52 දරන පුනරුත්ථාපන සහ අධ්‍යාපන සංවර්ධන අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත

---

[ සහතිකය සටහන් කළේ 1999 දෙසැම්බර් මස 14 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1999 දෙසැම්බර් මස 17 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 6. 75 තැපැල් ගාස්තුව : රු:3. 50

## 1999 අංක 52 දරන පුනරුත්ථාපන සහ අධ්‍යාපන සංවර්ධන අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1999 දෙසැම්බර් මස 14 වැනි දින.]

එල්.ඩී. – ඕ. 2/94.

## පුනරුත්ථාපන සහ අධ්‍යාපන සංවර්ධන අරමුදල සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"පුනරුත්ථාපන සහ අධ්‍යාපන සංවර්ධන අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන අරමුදලක් එකී අරමුදලේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව අරමුදලේ පරමාර්ථ සහ ඊට අදාළ කාරණා ඵලදායි ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද ; පූර්විකාව.

එකී අරමුදල පිහිටුවනු ලැබුයේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී අරමුදල සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් සහ එකී අරමුදල සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින්ද ;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 1999 අංක 52 දරන පුනරුත්ථාපන සහ අධ්‍යාපන සංවර්ධන අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (1) මෙම පනත ආරම්භ වූ දින හා ඉන් පසුව පුනරුත්ථාපන සහ අධ්‍යාපන සංවර්ධන අරමුදලේ දැනට සිටින අධ්‍යක්ෂ මණ්ඩලය (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "පුනරුත්ථාපන සහ අධ්‍යාපන සංවර්ධන අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන්නේ ය. තවද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. පුනරුත්ථාපන සහ අධ්‍යාපන සංවර්ධන අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය සංස්ථාගත කිරීම.

**3**. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :- සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) ශ්‍රී ලාංකික ජනතාවගේ අධ්‍යාපනික, ආගමික, සංස්කෘතික, සමාජයීය සහ ආර්ථික සුභසාධනය දියුණු කර ප්‍රවර්ධනය කිරීම ;

H - 022545

(ආ) පොදුවේ ශ්‍රී ලාංකික ජනතාව අතර, විශේෂයෙන්ම ද්‍රවිඩ ජනතාව අතර, පවතින සමාජයීය හා වෙනත් විෂමතාවන් දුරු කිරීම සඳහා කටයුතු කිරීම ;

(ඇ) ශ්‍රී ලංකාවේ ඌන සංවර්ධිත හා සමාජයීය වශයෙන් අවාසිදායක ජනතාවගේ විශේෂයෙන්ම සාකල්‍ය සමාජ ප්‍රවර්ධනයෙහි ලා ප්‍රමාණවත් ප්‍රගතියකට එළඹ නැති ශ්‍රී ලංකාවෙහි උතුරේ සහ නැගෙනහිර පිවත්වන "නවතාර් "ජන කොට්ඨාසයට අයත් තැනැත්තන්ගේ සාකල්‍ය අභිවෘද්ධිය ප්‍රවර්ධනය කිරීම ;

(ඈ) පොදුවේ ශ්‍රී ලාංකික ජනතාව අතර, විශේෂයෙන්ම ද්‍රවිඩ ජනතාව අතර, හොඳහිත සහ සුහදතාව ප්‍රවර්ධනය කිරීම සහ එක්සත්භාවය සඳහා ඔවුන් ධෛර්යමත් කිරීම;

(ඉ) ද්‍රවිඩ භාෂාව, සාහිත්‍යය සහ සංස්කෘතිය නංවාලීම සහ ප්‍රවර්ධනය කිරීම ;

(ඊ) ප්‍රාථමික, ද්විතීයික හා උසස් අධ්‍යාපනය සඳහා මූල්‍ය පහසුකම් සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම ;

(උ) අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්ව අරමුදල් ලබාගැනීම, පවත්වා ගෙන යාම සහ පරිපාලනය කිරීම ;

(ඌ) තරග, වාද, විවාද, දේශන සාකච්ඡා, ප්‍රදර්ශන සහ නිරූපණ ප්‍රවර්ධනය කිරීම, ධෛර්යමත් කිරීම සහ ඒවාට ආධාර කිරීම සහ සභරා. සමරු කලාප, අධ්‍යයන පත්‍රිකා සහ අනෙකුත් සාහිත්‍යමය පත්‍රිකා මුද්‍රණය කිරීම සහ ප්‍රසිද්ධ කිරීම ;

(එ) පුස්තකාල, කියවීම් ශාලා සහ අධ්‍යාපන කව පිහිටුවීම සහ පවත්වා ගෙන යාම ;

(ඒ) අධ්‍යාපනය, කළමනාකරණය, වෙළෙඳ, කාර්මික, කෘෂිකාර්මික සහ සුභසාධක කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා උපදේශක සේවාවන් සහ පුහුණු සේවා සැපයීම ;

(ඔ) වැන්දඹු, අනාථ, අසරණ හා සිවිල් කලහවලින් හානි පැමිණිවුනට සහ ආබාධිත පුද්ගලයන්ට මුදලින් හෝ අන් ආකාරයකින් උදව් කිරීම ;

(ඕ) වැඩිහිටි සහ අසරණ තැනැත්තන්ට මහලු නිවාස සහ අනාථාගාර ඉදිකිරීම, පරිපාලනය කිරීම සහ පවත්වාගෙන යාම ;

(ක) ණය පහසුකම් ලබා දී හෝ නොදී වෙළෙඳ කෘෂිකාර්මික හෝ කාර්මික කටයුතුවලට අදාළ ව්‍යාපෘති භාර ගැනීමට පුද්ගලයන්ට ධෛර්යය දීම, ඒවා සංවිධාන කිරීම සහ ප්‍රවර්ධනය කිරීම ;

(ග) මරණාධාර අරමුදලක්, නිවාස සහ ණය යෝජනාක්‍රම ඇති කිරීම, පවත්වා ගෙන යාම සහ ඒවා පරිපාලනය කිරීම

(ච) රාජ්‍ය ආයතන සහ රාජ්‍ය නොවන ආයතන මගින් භාරගනු ලබන සහනාධාර, පුනරුත්ථාපන ප්‍රතිසංස්කරණ. නිවාස හෝ වෙනත් ශුභසාධන කටයුතු සඳහා ආධාර කිරීම

(ජ) සංස්ථාවේ ඉහත සඳහන් පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීමට අවශ්‍ය හෝ හිතකර අනෙකුත් සියලු ක්‍රියා සහ දේවල් කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4**. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වා ගෙන යාමේ සහ වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ සහ ලබා ගැනීමේ ද, සම්මාදම් මුදල්, ආධාර මුදල් හෝ පරිත්‍යාග භාරගැනීමේ සහ එකතු කිරීමේ ද, ස්වකීය මුදල් ආයෝජනය කිරීමේ ද, පුද්ගල ඇප මත හෝ අන් ආකාරයකින් ණය දීමේ සහ සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගෙන යාම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීමේ, සේවයේ නියුක්ත කරවීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද, බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ සියල්ලම හෝ ඉන් කිසිවක් ප්‍රවර්ධනය කිරීමේ සහ වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වන හෝ යෝග්‍ය වන සියලු ක්‍රියා, කාරණා සහ දේ ඉටු කිරීමේ, සිදු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය. :-

සංස්ථාවේ රීති.

**5**. (1) සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනුකූල නොවන රීති පහත දැක්වෙන සියලු කාරණා සඳහා සෑදීම නීත්‍යානුකූල වන්නේ ය.

(අ) සංස්ථාවේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම, ඔවුන්ගේ බලතල, කාර්ය සහ පැවැත්ම ;

(ආ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීම සහ ඔවුන්ගේ බලතල, පැවැත්ම සහ කර්තව්‍ය ;

(ඇ) අර්ථලාභීන් තේරීමේ මිමි සහ විවිධ අර්ථලාභී කාණ්ඩායම් අතර සම්පත් බෙදා වෙන් කිරීම ;

(ඈ) සංස්ථාවේ මුදල් එකතු කිරීම, ආයෝජනය කිරීම, වියදම් කිරීම සහ බැංකු ගිණුම් ආරම්භ කිරීම හා ක්‍රියාත්මක කිරීම ;

(ඉ) සංස්ථාවේ, රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම පැවැත්විය යුතු වේලාවන්, ස්ථාන, එම රැස්වීම්වල න්‍යාය පත්‍ර ගණපූරණය සහ ඒ රැස්වීම්වල දී සාකච්ඡාවට භාජනය කළ යුතු කරුණු ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, සංස්ථාවේ අරමුදල්වල භාරකාරත්වය හා සංස්ථාවේ ගිණුම් පවත්වා ගෙන යාම හා ඒවා විගණනය කිරීම ;

(උ) සංස්ථාව සහ ප්‍රජා සංවර්ධන සමිති සම්මේලනය සහ එහි සාමාජික සමිති සංස්ථාව සමග ඒකාබද්ධ කිරීම සඳහා නියමයන් සහ කොන්දේසි ; සහ

(ඌ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) පදනම විසින් සාදනු ලැබ තත් කාලයෙහි බලපවත්නා පදනමෙහි රීති සහ මින් පසුව සම්මත කර ගන්නා යම් රීතියක් (1) වන උප වගන්තිය යටතේ රීතියක් සාදනු ලබන ආකාරයෙන් එවැනිම රැස්වීමක දී සහ එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවැති පුනරුත්ථාපන සහ අධ්‍යාපන සංවර්ධන අරමුදලේ රීති, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවනතාක් දුරට මේ වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ සියලුම සාමාජිකයන් සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

6. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව සතු කරනු ලබන චංචල හෝ නිශ්චල දේපළක් ගැනීමට හා දැරීමට නීතිය අනුව හැකියාව හා ශක්නුතාව සංස්ථාවට ඇති අතර, ඒ සියලු දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදුදීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, සංස්ථාවේ තත්කාලයෙහි බලපවත්නා රීතිවලට යටත්ව සංස්ථාව විසින් මේ පනතේ කාර්ය සඳහා ඒ සියලු දේපළ දරනු ලැබිය යුතු ය.

අරමුදල විසින් සහ අරමුදලට ගෙවිය යුතු ණය.

7. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි පුනරුත්ථාපන සහ අධ්‍යාපන සංවර්ධන අරමුදලෙහි පැවති සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට පුනරුත්ථාපන සහ අධ්‍යාපන සංවර්ධන අරමුදලට ගෙවිය යුතු සියලු ණය සහ ග්‍රාහක මුදල් සහ මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

ප්‍රජා සංවර්ධන සමිති සම්මේලනය හා එහි සාමාජික සමිති සංස්ථාවට අනුබද්ධ සංස්ථා බව.

8. ප්‍රජා සංවර්ධන සමිති සම්මේලනය සහ එහි සාමාජික සමිති මේ පනත යටතේ සාදන ලද රීති අනුව සංස්ථාවට අනුබද්ධ කර ගත හැකි වන්නේ ය.

විසුරුවා හැරීමෙන් පසු ඉතිරිවන දේපළ.

9. (1) තත්කාර්ය සඳහා කැඳවනු ලබන සාමාජිකයන්ගේ විශේෂ මහා සභා රැස්වීමක දී පැමිණ ඡන්දය දෙන සාමාජිකයන් තුනෙන් දෙකක ඡන්දයෙන් මිස සංස්ථාව විසුරුවා නොහැරිය යුතු ය.

(2) සංස්ථාව විසුරුවා හැරීමේදී සංස්ථාවේ සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු යම් දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, ප්‍රජා සංවර්ධන සමිති සම්මේලනයේ හා/හෝ ඊට අනුබද්ධ සාමාජික සමිතිවල පරමාර්ථ ප්‍රවර්ධනය කර ගැනීම සහ ඉටු කර ගැනීම සඳහා ප්‍රජා සංවර්ධන සමිති සම්මේලනයට හෝ ඊට අනුබද්ධ සාමාජික සමිතිවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**10**. සංස්ථාවේ මුද්‍රාව, සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂවරයා භාරයේ තිබිය යුතු අතර, අවශ්‍ය විට සංස්ථාව විසින් තීරණය කරනු ලබන ආකාරයට එය වෙනස් කරනු ලැබිය හැකි ය. ඒ මුද්‍රාව සංස්ථාවෙහි අනුමැතිය ඇතිව සහ සංස්ථාව විසින් බලය දෙනු ලැබූ අධ්‍යක්ෂවරුන් දෙදෙනකු ඉදිරිපිට දී මිස කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. ඔවුන් ඉදිරිපිට දී ඒ සාධන පත්‍රයෙහි මුද්‍රාව තැබූ බවට සලකුණක් වශයෙන් තම නම අත්සන් කළ යුතු ය.එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම්තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

විගණනය සහ ගිණුම්.

**11**. (අ) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(ආ) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(ඇ) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන් -

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද, එමෙන් ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරි සමාගමක්,

අදහස් වේ.

**12**. මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් වෙතින් ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**13**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු.870 කි. (විදේශීය) රු.1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.